ලක්බිම Online Edition

21 පෙබරවාරි 2006

---

# එල්.ටී.ටී.ඊ.යට ඕනෑවී තිබෙන්නේ සාමය සඳහා තමන්ගේ කැපවීම පෙන්වන්න විතරයි

## නීතිඥ ගිරාල් ලක්තිලක

*සාකච්ඡා කළේ - චාමර ලක්ෂාන් කුමාර*

- "ජිනීවා" සාකච්ඡාවල ඇති වැදගත්කම මොකක්ද කියන කාරණය කතාබහට පිවිසුමක් විදිහට මුලින්ම පැහැදිලි කරගත්තොත්.............

මම හිතන විදිහට ජිනීවා සාකච්ඡාවල පළමුවෙනි අරමුණ වෙලා තියෙන්නේ දෙපාර්ශ්වය හමුවීම විතරයි. ඊට වැඩිය දෙයක් තියෙනවාය කියලා මම හිතන්නේ නැහැ. ඒ තුළ සාකච්ඡාවට පසුබිමක් හදන්න පුළුවන්ද කියන එක තමයි හොයා බැලිය යුත්තේ. ඒ සාකච්ඡාවලට පසුබිම හැදෙන්නේ කරුණු දෙකක් මතයි. පවතින සටන් විරාම ගිවිසුමේ 1.8 වගන්තිය පිළිබඳ පාර්ශ්ව දෙකේ මත දෙකක් තියෙනවා. ඒ මත දෙකේ කරුණු දෙකක් තියෙනවා. එයින් එකක් තමයි 1.8 වගන්තිය නිශ්චිතව ක්‍රියාත්මක කළාද, නැද්ද කියන එක. මෙතැනදී ශ්‍රී ලංකා රජයේ මතය තමයි 1.8 නිශ්චිතව ක්‍රියාත්මක කරලා තියෙනවාය කියන එක. එත් එල්.ටී.ටී.ඊ.ය කියන්නේ මේ වගන්තිය නිශ්චිතව ක්‍රියා-ත්මක කරලා නැහැ කියලයි. ගැටුම් කළමනාකරණ විද්‍යාවෙන් කතා කරනවා නම් මේක දත්තමය ගැටුමක්. "පැරා මිලටරි කණ්ඩායම්" සටන් විරාම ගිවිසුමේ සිට දවස් 30ක් ඇතුළත නිරායුධ කළ යුතුයි කියලා 1.8 වගන්තියේ කියනවා. මේ සම්බන්ධව ශ්‍රී ලංකා ආණ්ඩුවේ මතය විදියට දැනට පෙන්නුම් කරලා තියෙන්නේ 1.8 යටතට වැටෙන සියලුම "පැරා" මිලටරි හමුදාවන් විසුරුවා හැරම හෝ ආණ්ඩුවේ හමුදාවනට ඇතුළුදෑකර ගත්තාය කියලයි. මෙහිදී කරුණා සාධකයත් මේක ඇතුළට වැටෙන බව එල්.ටී.ටී.ඊ.ය කියනවා. එත් ආණ්ඩුව කියන්නේ එක අර වගන්තිය ඇතුළට වැටෙන්නේ නැහැ කියලයි. මේ විදිහට ප්‍රධාන වශයෙන් දත්තමය ගැටුමක් දෙපාර්ශ්වය අතර තියෙනවා.

- 2002 දී සටන් විරාම ගිවිසුම අත්සන් කරන විට කරුණා එල්.ටී.ටී.ඊ.ය සමග හිටියා. විශේෂයෙන් සටන් විරාම ගිවිසුම අත්සන් කරද්දී එල්.ටී.ටී.ඊ. නොවන අනෙ-කුත් දෙමළ සන්නද්ධ කණ්ඩායම් විදිහට එල්.ටී.ටී.ඊ.ය දැක්කේ ඊ.පී.ඩී.පී., ඊ.පී.ආර්.එල්.එෆ් වගේ කණ්ඩායම්. මේ තත්ත්වය ඇතුලේ කරුණා පිළිබඳ වගකීමක් තමනට නැතැයි ආණ්ඩුව මතු කරන තර්කය සාධාරණයි නේද?

අර මම කියපු දෙවැනි කරුණා සම්පූර්ණයෙන් කරකැවෙන්නේ ඔය කාරණය මත. සාකච්ඡා ඉදිරියට යනවද නැද්ද කියන එක තීරණය වෙන්නේ මේ සඳහා ප්‍රායෝගික විසඳුමක් හොයා ගැනීම තුළයි. මේ සම්බන්ධව ඇති රජයේ ස්ථාවරය ගත්තොත් එක තාර්කිකව නිවැරදියි. එත් ඕනෑම ගිවිසුමක එ වේලාවේ පවතින තත්ත්වයන්ට වගේම අනාගතයේ ඇතිවිය හැකි තත්ත්වයන් සඳහාත් යම් සංවරණ හා තුලනයක් පැවතිය යුතුයි. එත් මේ ගිවිසුමේ එහෙම දෙයක් නැහැ. ඒ නිසා මේ ගිවිසුමට එවැනි සංවරණ හා තුලන ක්‍රමයක් ඇතුල් කරගන්නේ කොහොමද කියලා රජය හා එල්.ටී.ටී.ඊ.ය සාකච්ඡා කළ යුතු වෙනවා. ඒ තුළ කරුණා සාධකය පිළිබඳ ප්‍රශ්නය විසඳාගන්නේ කොහොමද කියන එක සාකච්ඡා කළ යුතු වෙනවා. ඒ වගේම මෙතැන තවත් පැත්තක් තියෙනවා. අද කරුණා සාධකය කියන්නේ බරපතල විදිහට දේශපාල-නීකරණය වෙලා තියෙන දෙයක්. මේ දේශපාලනී-කරණය වීම ඇතුළේ කරුණා සාධකය නිෂ්ක්‍රීය කිරම තමන්ට විශාල අවාසියක් ඇති කරනවාය කියලා සිංහල සමාජය ඉතාම බරපතල විදිහට විශ්වාස කරනවා. එක හුදු මතයක්ම විතරක් නෙමෙයි. ඒ වගේම මේක රජයට තියෙන එක ප්‍රධාන තුරුම්පුවක්. එල්.ටී.ටී.ඊ.යේ ඉල්ලීමට අනුව මේ තුරුම්පුව අත්හැරම තුළ රජයට දේශපාලනිකව වගේම මිලටරිමය අවාසියකුත් තියෙනවාය කියලා මතයක් අද සමාජ ගත වෙලා තියෙනවා. ඒ නිසා මේක විශාල සංකීර්ණ තත්ත්වයක් ඇති කරලා තියෙනවා. ඒ නිසා බොහොම පැහැදිලිවම සම්පූර්ණ සාකච්ඡාවල, සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය පදනම් වෙන්නේ මේ කාරණය ඉදිරියේ දෙපාර්ශවය හැසිරෙන ආකාරය අනුවයි.

- නැවතත් යුද්ධයක් ඇතිවීම වැළැක්වීමට නම් කරුණාගෙ හමුදා විසුරුවා හැරිය යුතු බව එල්.ටී.ටී.ඊ.ය කියනවා. එත් ඒ ඉල්ලීමට එකඟවීමම කියන්නේ නැවත යුද්ධයක් ඇතිවීමක්..... ඒ පැහැදිලිවම කරුණා කියන්නේ දේශපාලනික චරිතයකට වඩා මිලටරිමය චරිතයක් නිසයි.............

ඔව්. එක ඇත්ත. කරුණාගෙ ප්‍රශ්නය පිළිබඳ මගේ යෝජනාව වන්නේ කේවල් කිරමේ ස්ථාවරයෙන් පරිබාහිර පැත්තකට ගිහිල්ලා මේ තත්ත්වය ඊට වඩා වෙනස් විදිහට සිතා ගැනීමට අවශ්‍යයි කියලයි. දැනට තියෙන තරක ඇතුලේ ගියොත් මේ ප්‍රශ්නයට විසඳුමක් හොයාගන්න බැහැ. මම මුලින් කිව්වා වගේ මෙතැන තියෙන්නේ දත්තමය ගැටුමක්. මූලිකවම දත්තමය ගැටුමකදී යම් ස්ථාවරයන් පිළිබඳ පාර්ශව දෙක අතර වෙනස් මත තියෙනවා. ඊළඟට ඒ වෙනස් මත අදාළ කර ගැනීම පිළිබඳ වෙනස් මතයක් තියෙනවා. ඒ අදාළ දත්තය විශ්ලේෂණය කරගැනීමේ මිනුම් දඬුවල එකඟතාවක් නැතිවීම ඇතුළෙයි එහෙම වෙන්නේ. ඒ නිසා මේ පාර්ශව දෙක මිනුම් දඬු පිළිබඳ කිසියම් එකඟතාවකට පැමිණීම මේ මොහොතේ අවශ්‍ය වී තියෙනවා. ඒ මිනුම් දඬු ගොඩනැගීමට දෙපාර්ශව-යේම විශ්වාසයක් තිබිය යුතුයි. එත් ඒ වෙනුවට මේ මොහොතේ දෙපාර්ශවයටම එකිනෙකා කෙරෙහි තියෙන්නේ අවිශ්වාසයක්. කොයි මොහොතේ සතුරා තමන්ට පහර දෙයිද නැද්ද කියන ස්ථාවරයකුයි දෙපැත්තටම දැන් තියෙන්නේ.

- මේ වගේ දත්තමය ගැටුමක් පවතින විට මේ හා සමාන ජාත්‍යන්තර අත්දැකීම් අපිට අනිවාර්යයෙන්ම වැදගත් වෙනවා. ඒ පිළිබඳවත් යමක් කතා කළොත්.........

ඔව්. මෙවැනි දත්තමය ගැටුමක් පවතින අවස්ථාවක වෙන රටවල කරලා තියෙන ප්‍රධානතම දෙයක් තමයි මොනම තත්ත්වයක් යටතේවත් තමන් සාකච්ඡාවලින් බැහැ-රවෙන්නේ නැහැය කියලා මූලික එකඟතාවකට දෙපාර්ශවයම එළඹීම. ඒ විදිහට යුද්ධ කරන්නේ නැහැ එකිනෙකා මරා දැමීමේ දේශපාලනයෙන් බැහැර-වෙනවාය කියලා ස්ථාව-රවලට පැමිණෙනවා උදාහරණයක් විදිහට උතුරු අයර්ලන්ත ප්‍රශ්නයේදී ජෝන් මිචෙල් අයර්ලන්ත ගරිල්ලා හමුදාව හා බ්‍රිතාන්‍ය පාලකයන්ව යම් කිසි

එකඟතා රාමුවකට ගෙනාවා. ඒ වගේ මූලික ප්‍රතිපත්තිමය රාමුවකට මේ පාර්ශවයන් ගෙන ආ යුතුයි. එතැනදී මූලිකම දේ තමයි මොනයම් තත්ත්වයකදී හෝ දෙපාර්ශවය නැවත යුද්ධයකට යන්නේ නැහැය කියන එකඟතාව. ඒ වගේම එකිනෙකාට පහරදීම සඳහා හෙවනැලි යුද්ධයක් පවත්වාගෙන යන්නේ නැහැය කියන එකඟ-තාවට පැමිණීමත් වැදගත්. ඊළඟට පාර්ශව දෙක අතර විශ්වාසය ගොඩ-නැගීමේ ක්‍රියා-වලියේදී දෙපා-ර්ශවයට ඇති ප්‍රශ්නය හඳුනා-ගැනීමත් වැදගත්. එත් ශ්‍රී ලංකා රජය ජිනීවා සාකච්ඡාව-

ලට යන්නේ එල්.ටී.ටී.ඊ.ය කියන්නේ ත්‍රස-තවාදී සංවි-ධානයක්ය කියන ස්ථාවරය ඉද-ගෙනයි. එක මෙතැන තියෙන විශාල ප්‍රශ්නයක්. ඒ තුළ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් මෙතැන තියෙන මානුෂික පදනම යටපත් කරලා තියෙනවා. ඒ තත්ත්වය ඇතුළේ මම මුලින් කිව්වා වගේ යම් කිසි මූලික මූලධර්ම රාමුවකට පාර්ශවයන් දෙක යොමු කරගන්න බැරිවෙනවා. ඒ නිසා ජිනීවා සාකච්ඡාවලදී 1.8 වගන්තිය ගැන කතා කරන්නේ නැතිව මූලික ප්‍රතිපත්තිමය රාමුවකට දෙපාර්ශවය එකඟ කර ගන්න නෝර්වේජියානු පහසුකම් සපයන්නාට පුළුවන් වුණොත් මේ සාකච්ඡා ඉස්සරහට ගෙනියන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. එත් එහෙම බැරි නම් මේ සාකච්ඡා මේ වටයෙන් හෝ තවත් එක වටයකින් අවසන් වෙන්න හොඳටම ඉඩකඩ තියෙනවා.

- මේ ප්‍රශ්නයේදී පහසුකම් සපයන්නා ලෙස නෝර්වේට එවැන්නක් සඳහා අවශ්‍ය ත්‍රිමාණ දෘෂ්ඨියක් තියෙනවාය කියලා ඔබ හිතනවාද?

ප්‍රශ්නෙ තියෙන්නේ එතැන තමයි. මෙවැනි ඉතා සංකීර්ණ දිගගැස්සුණු යුද්ධයකට ඇතුල්වෙලා ඉන්න පාර්ශවයන් ගැටුම් නිරාකරණ ක්‍රියාවලියට ප්‍රවිශ්ඨ කර ගැනීමේ හැකියාව පසුගිය ඉතිහාසය තුළම නෝර්වේ රාජ්‍යයට තිබුණේ නැහැ. නෝර්වේ රාජ්‍යය හැමදාම කටයුතු කළේ පාර්ශවයන් දෙකේ තියෙන ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලියුම් බෙදා දෙන්නෙක් හැටියට විතරයි. එහෙම ක්‍රියා කරනවා මිසක මේ අය කෝවල් කිරමේ ක්‍රියාවලියෙන් එපිටට අරගෙන ඒ අයගේ අවශ්‍යතා තේරුම් අරගෙන ක්‍රියාත්මක වන වැඩපිළිවෙළකට නෝර්වේ රාජ්‍යය ගියේ නැහැ. ඒ නිසා මේක නෝර්වේට කරන්න පුළුවන් ද කියන ප්‍රශ්නය මටත් තියෙනවා.

- සාකච්ඡා සාර්ථක කර ගැනුමේදී ශ්‍රී ලංකා රජයට වගේම එල්.ටී.ටී.ඊ.යටත් අනිවාර්ය වගකීමක් තියෙ-නවා. නමුත් එල්.ටී.ටී.ඊ.යට ඇති මේ වගකීම ගැන දකුණේ මේ සම්බන්ධ කතිකාවේ ඉන්න බොහෝ දෙනෙක් කතා නොකරන තරම්........

පැහැදිලිවම එල්.ටී.ටී.ඊ.ය-ටත් වගකීමක් තියෙනවා. එක සුපැහිදිලියි. එත් මම දකින විදිහට අද එල්.ටී.ටී.ඊ.ය මේ දිහා බලන්නේ ඒ අයගේ මූලෝපායික අවශ්‍යතා පදනම් කරගෙනයි. මේ දක්වා තමන්ගේ ප්‍රධාන ව්‍යාපෘතියෙන් 60%ක් විතර සාර්ථක කරගෙන තියෙනවාය කියලා ඒ අය හිතනවා. ඉතුරු 40% මේ හරහා හෝ වෙනත් මාර්ගය-කින් උදා කරගන්නේ කෙසේද කියන මූලෝපායික මාර්ගයේ තමයි ඒ අය ගමන් කරන්නේ. ඒ නිසා ඔවුන්ට මේ සාකච්ඡා වටින්නේ සාමය සඳහා ඇති තමන්ගේ කැපවීම ජාත්‍යන්තර ප්‍රජාවට පෙන්වන්න මිසක් දෙපාර-ශවයේම එකඟතාවෙන් විසඳුමක් ගෙන ඒමේ අර්ථයකින් නෙමෙයි. එකට තව සාධකයක් බලපාලා තියෙනවා. ඒ තමයි මේ වෙනුවෙන් වන රජයේ ප්‍රවිශ්ඨය. රජයේ හරයාත්මක ප්‍රවිශ්ඨය ඒකීය විමධ්‍යගත විසඳුමක් ගෙන ඒම. එකට එල්.ටී.ටී.ඊ.ය කොහොම-ටවත්ම කැමති වෙන්නේ නැහැ. ඒ නිසා එල්.ටී.ටී.ඊ.ය අවංකවම කැමති වුණත් අනෙක්

පාර්ශ්වයට තියෙන ස්ථාවරය තුළ මේක සාර්ථක අවසානයක් කරා ගෙනි-යැමට හැකියාවක් නැහැ කියලයි මම හිතන්නේ.

- සාකච්ඡා කියන්නේ වදන් විශ්වය තුළ තියෙන අහිංසකම වචනයක්. නමුත් එල්.ටී.ටී.ඊ.ය හා රජය අතර සාකච්ඡාය කියන කොටම විශාල විරෝධයක් මීට පෙර දකුණේ සමාජයේ තිබුණා. නමුත් අද ඒ විරෝධය නැහැ. මේ තත්ත්වය සාමය කරා යන ගමනේදී ප්‍රයෝජනයට ගත හැක්කේ කොහො-මද?

මේ ගමන ඒ වාසිය තියෙන්නේ වෙනදා පාරට බැස්ස අය මෙදා සාකච්ඡා කරන නිසයි. එක අද තියෙන එක වාසිදායක තත්ත්වයක්. ශක්තියක්. ඒ වගේම දුර්වලතා ගණනාවකුත් තියෙනවා. අර ශක්තිය මේ දුර්වලතා මගහැරවීමට භාවිතා කරනවා නම් එක ඉතා හොඳයි. උදාහරණයක් විදිහට ෂැරොන් අගමැතිවරයා ඉතා බරපතල පලස්තීන විරෝධියෙක්. ඔහු තමයි යුදෙව් ජනාවාස පිහිටෙව්වේ. නමුත් අවසානයේදී ඔහු යුදෙව් ජනාවාස ඉවත් කළා. ඉවත් කරලා ඒ වැඩපිළිවෙළ ඉස්සරහට අරගෙන ගියා. මේ නිසා සාමවාදීන්ට වඩා දැඩි මතධාරන්ට සාමය ගේන්න හැකියාවක් තියෙනවාය කියලා අද ලෝකයේ මතයක් ඇති වෙමින් තියෙනවා. නමුත් එක කිරම සඳහාත් කිසියම් භරයාත්මක ප්‍රවිශ්ඨයක් අවශ්‍යයි. ඒ භරයාත්මක ප්‍රවිශ්ඨය මහින්ද චින්තනය පෙරටු කරගත්, ජ.වි.පෙ.ට හා හෙළ උරුමයට තියෙ-නවාද කියලා සැක සහිතයි. පැහැදිලිවම සාකච්ඡා කියන එක සුන්දර වචනයක් තමයි. සාකච්ඡා කියන වචනය හැම තිස්සෙම සුන්දර වෙන්නේ යුද්ධයට වැඩිය යුද්ධයෙන් වන විනාශයට වැඩිය දවසක් හරි එකෙන් විනාශය පරක්කු කර-ගන්න පුළුවන්. ඒ වෙනුවෙන් ජ.වි.පෙ., හෙළ උරුමය හා ඊට ප්‍රතිවිරුද්ධ මතධාරන් අතර සංවාදයක් අවශ්‍ය වී තියෙනවා. එත් ජ.වි.පෙ. හා හෙළ උරුමය දැඩි මත-වලම එල්බගෙනම තමන් දරන මතය හරිය කියමින් ඉන්නවා. එක අවාසනාවක්.

- ජ.වි.පෙ. හා හෙළ උරුමයේ ස්ථාවරයන් ගැන ප්‍රශ්න කරන ඔබ මේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස යෝජනා කරන්නේ දෙපඩරල් විසඳුමක්ද?

බලය බෙදීමක් තුළම එහෙමත් නැත්නම් දෙපඩරල් ක්‍රමයක් තුළ මේ ප්‍රශ්නය විසඳිය යුතුය කියලා මම කවදාවත් කියන්නේ නැහැ. ජ.වි.පෙ. හා හෙළ උරුමය විමධ්‍යගත කිරමක් තුළ මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා විශ්වාස කරනවා නම් එක කරන්න පුළුවන් ඒ සඳහා උදාහරණ ලෝකයේ ඕනෑතරම් තියෙනවා. නමුත් ඒ සඳහා හොඳ දැක්මක් අවශ්‍යයයි. උදාහරණයක් හැටියට ස්පාඤ්ඤය ඒකීය විමධ්‍යගත කිරමක් පිළිබඳ හොඳ උදාහරණයක්. ඉතාලියේ අල්දෙප් අඩිජෝ කියන ස්වයං පාලනය ඒකීය රාජ්‍යයක් තුළ දීලා තියෙනවා. මහින්ද රාජපකෂ මහතා කිව්වා වාගේ බ්‍රිතාන්‍යයත් හොඳ උදාහරණයක්. එහෙම උදාහරණ තියෙනවා. නමුත් ඒ හැම උදාහරණයක්ම ලංකාවේ අද තියෙන 13 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එපිටට ගිය දේවල් මිසක් මෙතැන ඉඳගෙන විසඳන්න පුළුවන් දෙ